උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය

**STATE MINISTRY OF HIGHER EDUCATION**


| | | |
|---|---|---|
| මගේ අංකය vdJ ,y. My No. | ඔබේ අංකය ckJ ,y. Your No. | දිනය jpfjp Date 2024-02-22 |

## මාධ්‍ය නිවේදනයයි

**2024/02/22 වන දින ප.ව.1.00 ට උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය කාර්යාලය, වෝඩ් පෙදෙස පරිශ්‍රයේදී උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍ය ආචාර්ය සුරේන් රාඝවන් අමාත්‍යතුමා විසින් පවත්වන ලද මාධ්‍ය නිවේදනයේ සාරාංශය.**

මෙම සාකච්ඡාවේ ප්‍රධාන අරමුණු 03ක් තිබෙන බව උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා විසින් අවධාරණය කරන ලදි.

**01.ජාතික මට්ටමින් සුවිශේෂී වූ වෙනස්කමක් සිදුවෙමින් පවතින බව.**

1978 බිහිකළ උසස් අධ්‍යාපනය සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙනුවට **ජාතික උසස් අධ්‍යාපන සංවර්ධන කොමිසන් සභාවක්** අළුතින් බිහිකරන්නට යන බව උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා විසින් පැහැදිලි කරන ලදි. මෙම නව ආකෘතිය යටතේ විශාල වෙනස්කම් රැසක් සිදුවීමට නියමිත අතර රාජ්‍ය විශ්වවිද්‍යාල ජාත්‍යන්තර උපාධි දෙන ආයතන බවට පත්කිරීමට බලාපොරොත්තු වන බව එතුමාගේ අදහස විය.

**02. විශ්වවිද්‍යාල ආචාර්ය මහාචාර්යවරුන් විදෙස් ගත වූ පසු එම හිඩැස පිරවීමේ ගැටලුව**

අපගේ බුද්ධි ගලනය ඉතා පෘථුල බවත් විශේෂයෙන් වෛද්‍ය විද්‍යාව සහ විශේෂිත ක්ෂේත්‍රයන්හී බොහෝ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් රටින් 600 ට වඩා සංක්‍රමණය වී ඇති බවත් තවත් 385ක් පමණ දීර්ඝ නිවාඩු (වැටුප් සහිත) ලබාගෙන තිබෙන බවත් බොහෝ දෙනෙක් නැවත ලංකාවට නොපැමිණෙන බවත් උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා විසින් අවධාරණය කරන ලදි. ශ්‍රී ලංකානු සම්භවයක් තිබෙන විදෙස් රටවල්හී වෙසෙන ශ්‍රී ලාංකීක විද්වතුන් ස්වෙච්ඡාවෙන් දායක වීම සඳහා ආරාධනා කරන බව එතුමා පවසන ලදි.

**03. නවක සිසුන් සඳහා විශ්වවිද්‍යාලයන්හී ආරක්ෂාව ලබා දීම.**

2023 වර්ෂයේදී ජාතික නවකවද විරෝධී කමිටුව ආරම්භ කරන ලද බවත් එය දැනට ක්‍රියාත්මකව පවතින බවත් ගරු රාජ්‍ය අමාත්‍යතුමා විසින් පවසන ලදි. රාජ්‍ය ආයතනයන් තුළ නවකවදය වැනි අමානුෂික ප්‍රතිපත්ති ගෙන යා නොහැකි බවත් ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාවට විරුද්ධ බවත් ලංකාවේ නීති පද්ධතියට විරුද්ධ බවත් අපගේ බුදු දහමට අනුව විරුද්ධ බවත් පුරවැසි අයිතිය සුරකීම රජයේ වගකීම බවත් එතුමා විසින් අවධාරණය කරන ලදි.

23/02/24

භාග්‍යා විදානගේ

අංක. 18, වෝඩ් පෙදෙස,
කොළඹ 07.

ගරු උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්


18, වෝඩ් පෙදෙස , කොළඹ 7.

18, Ward Place, Colombo 7.

Tel: 011-2697721 - 011-2691378 - 011-2694486 - 011-2697133

Fax: 011-2674768 - Web Site: www.mohe.gov.lk